# ජීවිතය සඳහා දවසක්...

## ඉතාලි රදගුරු මණ්ඩලයේ පණිවිඩය,

දරුවන් සෑම රටකටම ලොකු සම්පතකි. ඔවුන්ගේ අධ්‍යාපනය මෙන්ම ගෙදරින් ලබන ආදරය ඔවුන්ගේ අනාගත අභිවෘද්ධියට මහත් රුකුලක් වනු ඇත. සෑම රටකම වැඩිහිටියන් තරුණ පරපුරට ආදර්ශමත් විය යුතුය. ශිෂ්ඨාචාරව ජීවත්වීම තමාගේ රටට ගරුත්වයක් ලබා දෙනු ඇත. දෙමාපියන් දරුවකු පිළිසිඳ ගත්විට ඔවුන්ගේ වගකීම වනුයේ ඒ දරුවා ගබ්සා කර මරා නොදමා ජීවත් කරවීමයි. දරුවකු සෑම දෙමාපියෙකුගේම සතුට සහ ඔවුන්ගේ අනාගත බලාපොරොත්තුවයි. දෙමාපියන් තම දරුවන් ආදර්ශමත්ව හදා වඩා නිසි අධ්‍යාපනයක් ලබා දී සමාජයේ ගුණගරුක පුද්ගලයින් කරවීම ඔවුන්ගේ වගකීම බව මතක තබා ගත යුතුයි. දරුවන් ලොකු මහත් වනවිට ඔවුන් තම දෙමාපියන්ට ත්‍යාගශීලි, සමාජයට වැඩදායක පුද්ගලයින් විය යුතුයි.

ඔබගේ දරුවන් ඔබට වටිනා වස්තුවකි. අද සමාජයේ සමහර දෙමාපියන්ට දරුවන් නැතිව ප්‍රශ්ණවලට මුහුණදෙන්නට සිදුව ඇත. ඔවුන්ට දරුවකුගේ ආදරය ලබන්නට නම් වෙනත් කෙනෙකුගේ දරුවෙක් භාරගෙන (ADOPTION) තමන්ගේම දරුවකු ලෙස හදා වඩා ගැනීමට පුළුවන. ඒවිට ඔවුන්ගේ බලාපොරොත්තු මුදුන්පත් කරගත හැක.

ඔබගේ ජීවිතයේ කොතරම් බාධක කරදර පැමිණුනත් ඔබ ජීවිතයට ආදරය කල යුතුයි. අප දෙමාපියන් වයසට පත්වූ විට ඔවුන්ගේ හැකියාවන්, මතකය ටිකින් ටික බැහැර වන්නට පුළුවන. ඒවිට හැකි අය ඔවුන්ට ඇප උපස්ථාන කර ආදරයෙන් රැකබලා ගත යුතුයි. අපගේ ආත්මාභිමානය විය යුත්තේ සෑම ජීවිතයකටම ආදරය කිරීමයි.

ගරු පියතුමන්ලා, ගරු කන්‍යා සොහොයුරියන්, ගුරුවරුන් සහ වැඩිහිටියන් සැමගේ වගකීම වන්නේ දරුවන් බිහිකිරීම හෑල්ලුවට පත්නොකර තරුණ දෙමාපියන් දිරි ගැන්වීමයි. එවගේම වෛද්‍යවරු, හෙදියන් දරු උපත් සිදුකරනවා වෙනුවට ගබ්සා සිදුකර අහිංසක ජීවිත මරා නොදැමිය යුතුයි. ලෝකයේ සෑම ජාතිකයෙකුම ජීවිතයක් මරා නොදමා එම ජීවිතය ජීවත් කරවීමට දායකවීමෙන් අපගේ අනාගත දරු පරපුර ආරක්ෂා කර ගත හැක.